23 පිටුවෙන්

එමගින් ආර්ය සත්‍යයය හතරක් ලොවට අනාවරණය කරන්නේය.

(1)දුක,
(2)දුකට හේතුව,
(3)දුක නැතිකරගැනීමේ මාර්ගය,
(4)දුක නැතිකරගැනීම

එම ආර්ය සත්‍යයයන්ය.

එහිදී දුක පිළිබඳ කෙරෙන දේශනාවේ සඳහන් වන්නේ සංක්ෂිප්තව දක්වතොත් පංච උපාදාන ස්ඛන්ධයෝම ''දුක'' බවය. බුදු හාමුදුරුවෝ එලෙස පංච උපාදාන ස්ඛන්ධයම දුක බව පැවසුවද අපට බොහෝ විට දැනෙන්නේ එය සැපයක් ලෙසිනි. දුකින් මිදීමට අපට නොහැකිවී ඇත්තේ එබැවිනි. අපට වැරදී ඇත්තේ කොතැනකද කියා තේරුම් ගැනීමට පළමු කොට උත්සාහ කරමු. වරද නිවැරදි කරගැනීමට හැකි වන්නේ සිදුව ඇති වරද හඳුනාගැනීමෙන් පමණක් වන බැවිනි.

**සත්පුරුෂයෙක් යැයි සිතා සිටින මෑතක හඳුනාගත් අයෙකු දකින විට අප තුළ සැප වේදනා ඇතිවේ. මෙසේ කල්ගත වන අතර කිසිවෙක් හෝ එම පුද්ගලයා අසත්පුරුෂයෙක් බව ඔබට කියයි. එක්වරම එය පිළිගැනීමට අකමැතිවේ. ඔහු පිළිබඳ තොරතුරු විමසා බලයි. එසේ සොයා බලන විට දැනගන්නට ලැබෙන්නේ එය ඇත්තක් බවය. ඔහු බොහෝ නරක පුද්ගලයෙකු බවය. අපරාධකරුවෙකු බවය. දැන් එම පුද්ගලයා දැකීමේදී ඔබ තුළ හටගන්නේ පෙර මෙන් සැප වේදනා නොව ඊට හාත්පසින්ම වෙනස් දුක් වේදනාය. එකම අරමුණක් මුල්කොට ගෙන අවස්ථා දෙකකදී වෙනස් වේදනා දෙකක් ඇතිවන බව මෙයින් පැහැදිලිය.**



පළමු අවස්ථාවේදී ඇස ඉදිරියේ සිටින්නේද අසත්පුරුෂයාමය. එහෙත් ඔබ ඔහු සත්පුරුෂයෙකු සේ හඳුනාගනී. එය වැරදීමකි. දෙවෙනි අවස්ථාවේදී ඔබ ඉදිරියේ සිටින්නේද ඒ පුරුෂයාමය. එහිදී ඔබ ඔහු අසත්පුරුෂයෙකු ලෙස හඳුනා ගනී. වැරදීම සිදුවුණේ කොතැනද ? ඊට හේතුව කුමක්ද ? මේ අවස්ථා දෙකටම අදාළ වූයේ එකම ඇසය. ඇස ඉදිරියෙන් තිබුණේද එකම රූපය ය. එහෙත් පළමු අවස්ථාවේදී ඇසත් රූපයත් ගැටීමෙන් හටගත්තේ සැප වේදනා-වකි. දෙවෙනි අවස්ථාවේදී දුක් වේදනාවකි. ලෝක සම්මතය අනුව අසත්පුරුෂයකු දැකී-මෙන් හටගත යුත්තේ දුක් වේදනාවකි. එහෙත් පළමු අවස්ථාවේදී එය එසේ නොවී කිසියම් වැරදීමක් සිදුව ඇති බව පෙනෙයි. ඒ වරද සිදුව ඇත්තේ ''නොදැනීම'' හේතුවෙනි. නොදැනීම නිසා දුක් ඇතිවිය යුතු තැනෙක සැප ඇතිවේ.

කැල්කියුලේටරයක් සිහිපත් කරගන්න. ඔබ එහි පහේ ඉලක්කම තද කරන විට තිරයේ දිස්වන්නේ හත යැයි සිතන්න. එසේ නම් එහි යම් දෝෂයක් ඇති බව පැහැදිලිය. කො-පමණ උත්සාහ කළත් මෙය නිවැරදි කරගත නොහැකිවන තැන ඔබ එය විදුලි උපකරණ අලුත්වැඩියා කරන්නෙකුට දී නිවැරදි කරදෙන ලෙස කියයි. ඔහු එය රැගෙන ගලවා බලා යම් අලුත් වැඩියාවක්ද කර ඔබ අතට දෙයි. ''මේකේ වයර් දෙකක් මාරුවෙලා තිබුණේ. ඔන්න දැන් හරි.'' ඔබට නැවත එය දෙන ගමන් ඔහු කියයි. ඔබ එය අතට ගෙන පහේ ඉලක්කම ඔබා බලයි. එවිට තිරයේ පහ දිස්වෙයි. අලුත්වැඩියාකරු දෝෂය හඳුනාගෙන එය නිවැරදි කොට ඇති බව අවබෝධ කරගනියි. ඔහු කියූ පරිදි කැල්කියුලේටරයේ තිබී ඇති එකම වරද 'වයර් මාරුව' පමණක් බවද වටහා ගනියි. අලුත්වැඩියාකරු එම වරද ඇති තැන හඳුනාගෙන එයට පිළියම් යෙදූ පමණින්ම කැල්කියුලේටරය නිවැරදිව ක්‍රියාත්මක වීමට පටන් ගෙන ඇත. අනෙක් සියලු දෑ නිසි පරිදි තිබී ඇත. ඔබට ඒ පිළිබඳ අවබෝධයක් නොවූයෙන් ඔබ කොතරම් වෙහෙසුනද කැල්කියුලේටරය නිසි පරිදි ක්‍රියාත්මක වන තත්ත්වයකට පත් කරගැනීමට ඔබට නොහැකි විය. ඒ පිළිබඳ දැනීමක් ඇති පුද්ගලයා වරද ඇති තැන හඳුනාගෙන එතැන පමණක් නිවැරදි කිරීමෙන් කැල්කියුලේටරය යථා තත්ත්වයට පත් කළේය.

-ශ්‍රීලාල් සෙනෙවිරත්න

